37

# යථාර්ථ ප්‍රතිනිර්මාණ විධික්‍රමයක් වශයෙන් මායා යථාර්ථවාදයේ භාවිතය හා මොහාන් රාජ් මඩවලගේ නවකතා

*ලක්මාලි, ඩබ්ලිව්. ජී. ඩී. එන්.*[1]
*සේනානායක, සසී ලවන්දි.*[2]

යථාර්ථවාදයේ ප්‍රධාන අරමුණ තත්ත්වානුකූල ලෙසත්, තර්කානුකූල ලෙසත් මිනිස් සමාජය නිර්මාණය කිරීම ය. මේ හා සම්බන්ධ විවිධ ප්‍රභේද පවතින අතර මායා යථාර්ථවාදය එයින් එකකි. සත්‍ය ලෝකය හා සැබෑ ලෝකය සම්බන්ධ කරමින් සාහිත්‍ය නිර්මාණ බිහි කිරීමට අනුබල දීම මායා යථාර්ථවාදයේ දී සිදු වේ. මෙම මායා යථාර්ථවාදය පිළිබඳවත් මොහාන් රාජ් මඩවලගේ නවකතා පිළිබඳවත් විචාරවාදීන් විවිධ මත ඉදිරිපත් කළ ද, මොහාන් රාජ් මඩවලයන් භාවිත මායා යථාර්ථවාදය යථාර්ථ ප්‍රතිනිර්මාණයේ දී කෙතරම් දුරට සාර්ථකදැයි මේ දක්වා විමර්ශනාත්මක අධ්‍යයනයක් සිදු වී නොමැත. එබැවින් යථාර්ථ ප්‍රතිනිර්මාණ විධික්‍රමයක් වශයෙන් මායා යථාර්ථවාදයේ භාවිතය හා මොහාන් රාජ් මඩවලගේ නවකතා පිළිබඳ ව විමර්ශනාත්මක අධ්‍යයනයක් කිරීම මෙම පර්යේෂණය මඟින් සිදු වේ. එහි දී මොහාන් රාජ් මඩවලගේ සියලු ම නවකතා අධ්‍යයනය කිරීමටත්, ඔහුගේ කෘති පිළිබඳ ව රචනා වූ විචාර ග්‍රන්ථ අධ්‍යයනය කිරීමටත්, අන්තර්ජාලය මඟින් දත්ත ගවේෂණය කිරීමටත් අපේක්ෂා කෙරේ. මායා යථාර්ථවාදී රීතිය බටහිර සාහිත්‍ය ආභාසයෙන් මෙරට සාහිත්‍යයට එක්වුණු නවාංගයක් බැවින් එම රීතිය පිළිබඳ ව අධ්‍යයනය කිරීමත්, එම රීතිය අනුදත් නිර්මාණකරුවකුගේ නිර්මාණ විශ්ලේෂණය කිරීමත්, ඔහු විසින් අනුගමනය කරන ලද රීතිය කෙතරම් දුරට සාර්ථකදැයි අධ්‍යයනය කිරීමත්, ලොවීනා සිට රජිත දක්වා මඩවලයන්ගේ නවකතා නිර්මාණකරණයේ විශේෂතා අධ්‍යයනය කිරීමත් මෙම පර්යේෂණයේ මූලික අරමුණ වේ. එමඟින් මොහාන් රාජ්මඩවල මෙරට සිටින මායා යථාර්ථවාදය අනුගමනය කරන දක්ෂ ලේඛකයකු බව හඳුනාගත හැකි වීම මේ පර්යේෂණයේ ප්‍රතිඵලය සේ දැක්විය හැකි ය.

ප්‍රමුඛ පදඃ මායා යථාර්ථවාදය, නවකතා, බටහිර සාහිත්‍යය, මොහාන් රාජ් මඩවල, ප්‍රතිනිර්මාණය

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර. සිංහල අධ්‍යයනාංශය.* Wgdnwewerallagedara@gmail.com
*2 ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර. සිංහල අධ්‍යයනාංශය.* Sasisenanayakeuok@gmail.com